පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 03 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## බුද්ධ ධර්මය

පාසලේ නම: ...........................................................................................................

ශිෂ්‍යයාගේ / ශිෂ්‍යයාවගේ නම:...................................................................................

**කාලය- පැය $1\frac{1}{2}$**

**01 නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 වප් මඟුල් උත්සවයේ දී පියරජතුමා විසින් සිදුහත් කුමාරයාව භාර කළේ කාට ද?
I. කිරි මවුවරුන්ට  II. ඇමතිවරුන්ට  III. කිසාගෝතමියට

02 රජ්ජුමාලා තුළ මෛත්‍රී සහගත අදහස් ඇති වූයේ,
I සිටු දියණිය මුණ ගැසීමෙන් පසුව ය.
II බුදුරජාණන් වහන්සේ මුණගැසීමෙන් පසුව ය.
III රජතුමා මුණ ගැසීමෙන් පසුව ය.

03 මිගාර මාතු ප්‍රාසාදය නමින් ප්‍රසිද්ධියට පත් වූයේ,
I. ජේතවනාරාමය  II. වේළුවනාරාමය  III. පූර්වාරාමය

04 ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ රෝපණය කර ඇති උයන වන්නේ,
I. කුසිනාරා නුවර  II. මහමෙවුනා උයන  III. නාමල් උයන

05 සංඝමිත්තා පෙරහැර පවත්වන්නේ කුමන පොහොය දිනයේ දී ද?
I. දුරුතු පොහොය  II. වෙසක් පොහොය  III. උඳුවප් පොහොය

06 සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රීමහා බෝධිය ලංකාවට වැඩම කරන අවස්ථාවේදී මෙරට රජ කළ රජතුමා කවුද?
I. දේවානම්පියතිස්ස රජතුමා  II. වළගම්බා රජතුමා  III. දුටුගැමුණු රජතුමා

07 බුදු සසුනේ අග්‍ර දායිකා තනතුර ලැබුණේ කාට ද?
I. රජ්ජුමාලාට  II. කිසාගෝතමියට  III. විශාඛා මහා උපාසිකාවට

08 තිත්තිර ජාතකයෙන් අපට ගත හැකි ආදර්ශයක් වන්නේ,
I. වැඩිහිටියන්ට නොසැලකීම.  II. වැඩිහිටියන්ට සැලකීම.  III. තමා ගැන පමණක් සිතා කටයුතු කිරීම.

09 අප නිතර ම පුරුදු විය යුතු වන්නේ,
I ලද දෙයින් සතුටු වීමට ය.
II බොහෝ දේ රැස් කර තබා ගැනීමට ය.
III තමුන්ට නොමැති දේ ගැන පසුතැවිලි වීමට ය.

10 උපදේශාත්මක කවි ඇතුළත් ග්‍රන්ථයක් වන්නේ,
I. හත්පණ  II. හීන්සැරය  III. ලෝවැඩ සඟරාව

( ලකුණු 10 )

Education NCP - www.edncp.lk

02 බොඳු දරුවෙකු ලෙස පසඟ පිහිටුවා වඳින විට පොළොව ස්පර්ශ වන ඔබේ ශරීරයේ ස්ථාන 05 ලියන්න.

1. ................................................................ 2. ................................................................

3. ................................................................ 4. ................................................................

5. ................................................................

( ලකුණු 10 )

01 පහත දී ඇති උපදෙස් අනුව හිස් කොටු සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. සු | ........ | 3.ධෝ | ........ | ........ | |
| | | ........ | | | 5 ........ |
| 2. ස | ........ | ........ | | | ........ |
| | | 4. ය | ........ | ........ | ........ |

**හරහට**

01. සිදුහත් කුමරුගේ පියා මේ නමින් හඳුන්වයි.
02. සාසනය යන අරුත දෙයි
04. රාහුල කුමරුගේ මවගේ නමයි.

**පහළට**

03. ශාසනික වචනයකි.
05. තිත්තිර ජාතක කතාවේ දී අපට හමුවන සතෙකි.

( ලකුණු 10 )

04 පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01 වප් මඟුල් දවසේ සිදුහත් කුමාරයා ආනාපානසති භාවනාව වැඩුවේ ය. ( )

02 සුද්ධෝදන රජතුමා රජකම් කළේ සැවැත්නුවර ය. ( )

03 බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසා රජ්ජුමාලාට සෙත සැලසුණි. ( )

04 වේළුවනාරාමය පිහිටා ඇත්තේ රජගහ නුවරය. ( )

05 බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා අවුරුදු හතේ දී සෝවාන් වූයේ කිසාගෝතමී ය. ( )

( ලකුණු 10 )

05 පහත සඳහන් වන අපිළිවෙළට දීඇති කවි පිළිවෙළට සකස් කර හිස්තැනෙහි ලියන්න..

01 නොහොබින ආසාවන්ගෙන් දුරු වෙමු
සියපණ විලසට පර පණ සුරකිමු
බොරු බස රහ මෙර සඳහට ම දුරලමු
සොරකම් කෙරුමෙන් සැම දින වැළකෙමු

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................



Education NCP - www.edncp.lk

| | |
|---|---|
| 02 හොඳ දරුවන් | ලෙසින |
| ඔවා මිණි | පලඳින |
| රැක ගනිමු අප සැවො ම යහ | ගුණ |
| ගුරු මව්පියන් | නමදින |

...........................................................................................................

...........................................................................................................

...........................................................................................................

........................................................................................................... ( ලකුණු 10 )

**06 A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා නිවැරදි ව යා කරන්න.**

| A | B |
|---|---|
| 01 සංඝමිත්තා තෙරණියගේ පියා | වැඩිහිටියන්ට සලකමු |
| 02 සුභාෂිත වචනයකි | ධර්මාශෝක රජතුමා |
| 03 ශාක්‍යයන්ගේ මානය බිඳීමට | හොඳම මිතුරා |
| 04 සැපේදීත් දුකේදීත් පිහිට වන්නේ | බෝධි නම් වේ |
| 05 උසස් ම නුවණ | යමාමහ පෙළහැර පෑම |

( ලකුණු 10 )

**07 පහත ඡේදයේ දීඇති හිස්තැන්වලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

**( පොත් පෙරහැර , හිස මත , පුංචි අපේ පොත් පෙරහැර , හේවිසි කණ්ඩායම , පොත් )**

පොත් පෙරහැරේ අපි අරන් යන්නේ 01 ............................................ පෙරහැරේ මුලින් ම 02 " ............................................ "කියලා පුවරුව. ඊට පස්සේ 03 ............................................ .ඊට පස්සේ 04 ............................................ පොත් ගෙනි යන්න ඕන 05 ............................................ තියා ගෙනයි. ( ලකුණු 10 )

**08. පහත දී ඇති වාක්‍යයෙහි තද අකුරින් මුද්‍රිත වචනයේ තේරුම ලියන්න.**

01. අත්තම්මා වතුසුද්ද ගහෙන් මල් නෙළා **ධෝවනය** කළා ය. ............................................
02. අපි පන්සලට ගොස් බුදු මැදුර **ඇමදීම** කළ යුතුය. ............................................
03. පන්සලේ හාමුදුරුවෝ දානයෙන් පසු යහනෙහි **සැතපුණ හ.** ............................................
04. පොඩි හාමුදුරුවෝ බෝ මළුවට **වඩින** සේක. ............................................
05. උපාසක උපාසිකාවෝ දහවල් දානය **වළඳති.** ............................................

( ලකුණු 10 )

Education NCP - www.edncp.lk

**09 පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

01 බෝධි පූජාවක් පැවැත්වීමට පෙර අනුගමනය කළයුතු පිළිවෙත් 02ක් ලියන්න.

I. ............................................................................................................................................

II. ............................................................................................................................................

02 බෝධි පූජාවක් සඳහා අවශ්‍ය පූජා ද්‍රව්‍ය 04ක් ලියන්න.

I. ............................................................................ II. ............................................................................

III. ............................................................................ IV. ............................................................................

03 බුද්ධ පූජාවක් තබන ත්‍රිවිධ බෝධීන්වලින් 2ක් නම් කරන්න

I. ............................................................................ II. ............................................................................

04 බණ ඇසීමෙන් ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.

I. ............................................................................................................................................

II. ............................................................................................................................................

05 ධර්ම දේශනයක් පැවැත් වීමට පෙර අප විසින් පිළිපැදිය යුතු කරුණු 02ක් ලියන්න.

I. ............................................................................................................................................

II. ............................................................................................................................................

( ලකුණු 10 )

**10. පහත දී ඇති අවස්ථාව චිත්‍රයට නඟන්න.**

**"තම පවුලේ සියලු දෙනා ම එක් වී සමගියෙන් ගෙවත්ත පිරිසිදු කිරීම"** ( ලකුණු 10 )

**චිත්‍රයේ තිබිය යුතු අංග**

නිවස , ගෙවත්තේ මල් පලතුරු සහ වෙනත් වගාවන් , පවුලේ සාමාජිකයෝ , සතුන් , වැට හා ළිඳ

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI

**බුද්ධ ධර්මය - 3 ශ්‍රේණිය**
**2019 දෙවන වාර පරීක්ෂණය පිළිතුරු පත්‍රය**

01 01 I කිරි මව්වරුන්ට
02 II බුදු රජාණන් වහන්සේ මුණ ගැසීමෙන් පසුවය
03 III පූර්වාරාමය
04 II මහමෙවුනා උයන
05 III උඳුවප් පොහොය දිනයේ දි
06 I දේවානම්පියතිස්ස රජතුමා
07 III විශාඛා මහා උපාසිකාව
08 II වැඩිහිටියන්ට සැලකීම
09 I ලද දෙයින් සතුටු වීමටය
10 III ලෝවැඩ සඟරාව **(ලකුණු 10)**

**02** 01. නළල 02. දෙදණ / දණහිස් දෙක 03. වැලමිට දෙක / වැලමිටි
**(ලකුණු 10)**

**03** හරහට - 01. සුද්ධෝදන 02. සසුන 04. යසෝධරා
පහළට - 03. ධෝවනය 05. වඳුරා **(ලකුණු 10)**

**04.** 01. ✔ 02. ✖ 03. ✔ 04. ✔ 05. ✖ **(ලකුණු 10)**

**05.** 01 සිය පණ විලසට පර පණ සුරකිමු
සොරකම් කෙරුමෙන් සැම දින වැළකෙමු
නොහොබින ආසාවන්ගෙන් දුරු වෙමු
බොරු බස රහ මෙර සඳහට දුරලමු

02 ඔවා මිණි පලඳන
ගුරු මව් පියන් නමදින
හොඳ දරුවන් ලෙසින
රැක ගනිමු අපි සැවොම යහගුණ
**(ලකුණු 10)**

**06.** 01. ධර්මාශෝක රජතුමා 02. වැඩිහිටියන්ට සලකමු 03. යමා මහ පෙළහැර පෑම
04. හොඳම මිතුරා 05. බෝධි නම් වේ **(ලකුණු 10)**

**07.** 01. පොත් 02 පුංචි අපේ පොත් පෙරහැර 03. හේවිසි කණ්ඩායම
04. පොත් පෙරහැර 05. හිස මත **(ලකුණු 10)**

**08.** 01. සෝදනවා 02. අතුගෑම 03. නිදා ගැනීම
04. යනවා / එනවා 05. ආහාර ගන්නවා **(ලකුණු 10)**

**09** 01 නිවැරදි පිළිවෙත් ලියා ඇත්නම් ලකුණු දෙන්න
02 ලියා ඇති පූජා ද්‍රව්‍ය අනුව ලකුණු දෙන්න
03 වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ
04 නිවැරදි පිළිතුරු අනුව ලකුණු දෙන්න.
05 නිවැරදි පිළිතුරු අනුව ලකුණු දෙන්න. **(ලකුණු 10)**

**10.** උපදෙස් අනුව අංග ඇතුළත් කර තිබේ නම් හා පාට කර තිබේ නම් අදාළ ලකුණු ලබා දෙන්න.
**(ලකුණු 10)**

PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440